දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 32 /2015

මගේ අංකය: එස්.ටී.පී/පී.එස්/2015,

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ - 09

2015.12.22 දින.

<u>සියලුම අධිකාරී/සහකාර අධිකාරීවරුන් වෙත,</u>

<u>2015 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සම්බන්ධවයි.</u>

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක:එෆ්.අයි.එන්/1051/එෆ්/192/18/ඒ.බී/ඩී හා 1985.06.18 දාතමැති චක්‍රලේඛයෙහි දෙවන (2) ඡේදයට ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එහි දෙවන ඡේදය අනුව 2015 වර්ෂයේ පාලන වාර්තාව 2016 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට ප්‍රථම මා විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කල යුතුය.

03. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සෑම ආයතනයකින්ම වාර්තා ලබාගෙන සංඛ්‍යා දත්ත චක්‍ර ගතකර සම්පිණ්ඩනය හර දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සැකසිය යුතුය.

04. <u>ඔබ ආයතනයේ 2015 වර්ෂයේ සංඛ්‍යාලේඛන වාර්තාව 2016 පෙබරවාරි මස 15 වන දිනට පෙර මෙම කාර්යාලයට එවීම අනිවාර්ය වන අතර, ඉතා පැහැදිලිව හා නිවැරදිව සංසන්දනාත්මක දත්තයන් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම බව සැලකිය යුතුය.</u>

05. සංඛ්‍යාලේඛන වාර්තාව සැකසීමට අදාල සියලුම ආකෘතිපත් මේ සමග එවන අතර, එහි පිටපතක් ඔබ කාර්යාලයෙහිද තබා ගැනීමට වගබලා ගතයුතුය.

06. දත්ත සටහන් කිරීමෙන් පසුව සියල්ල ඉතා නිවැරදි බවට අංශ භාර ජේලර්වරයා විසින් වෙන් වෙන්ව පරීක්ෂා කර සෑම පිටුවකම රබර් මුද්‍රාව තබා අත්සන යෙදිය යුතුය.

07. මෙම වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත සටහන් පොත් ඔබ වෙත ලැබුණ බව දැනුම් දීමට කටයුතු කල යුතුය.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
කොළඹ 09.